වාර්තාව 01

(15)

පාර්ලිමේන්තු ප්‍රකාශන මලා අංක : 222

ආයතනයේ නම : රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය

පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග 119(4) යටතේ ගරු අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම

பாராளுமன்ற வெளியீட்டுத் தொடர் இலக்கம் - 222

நிறுவனத்தின் பெயர் : பொது நிறுவாக மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சு

பாராளுமன்றத்தின் அரச கணக்குக் குழுவினால் முன்வைக்கப்பட்ட அறிக்கை தொடர்பாக நிலையியற் கட்டளை இலக்கம் 119(4) இன் கீழ் கௌரவ அமைச்சரின் அவதானிப்புகளும் மற்றும் அது தொடர்பாக எடுக்கப்படும் நடவடிக்கைகளும் பாராளுமன்றத்திற்கு சமர்ப்பித்தல்

**Parliamentary Series No : 222**

**Name of the Institution : Ministry of Public Administration, Provincial Councils and Local Government**

**Submission of observations of Hon. Minister and steps taken with regard to the reports tabled by the Committee on Public Accounts in terms of Standing Order No 119(4)**

Scanned with MOBILE SCANNER

# පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා 222

**සබරගමුව පළාත් සභාව සඳහා 2023.09.21 දින**
**පැවති රජයේ ගිණුම් පිළිබඳ කාරක සභා රැස්වීමේදී රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය**
**වෙත ලබාදෙන ලද නියෝග වලට අදාලව ගෙන ඇති පියවර**

| කාරණාවට අදාල අංකය | කමිටුව විසින් හඳුනාගෙන ඇති අඩුපාඩු | අඩුපාඩු නිවැරදි කිරීමට ආයතනය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග /වර්තමාන තත්ත්වය |
|---|---|---|
| 05 | විගණකාධිපතිවරයාගේ සටහන -ඡේද අංක 2.2 (පළාත් සභා ලේකම් කාර්යාලය - යොමු අංකය 2022, 1.5.2(ආ)).<br><br>පළාත් සභා ලේකම් කාර්යාලයට අනුයුක්තව 22 දෙනෙකු සේවය කරමින් සිටින නමුදු පළාත් සභා විසුරුවා හැරීම නිසා කාරක සභා ඇතුළු විශාල කාර්යයභාරයක් අක්‍රිය වී තිබීම. එසේ වවුද, වර්ෂ 05 ක් කාලයක සිට පවතින සේවක අතිරික්තය, සභාවේ කාර්යයන් නැවත ආරම්භ කරන තෙක් ඵලදායි ලෙස වෙනත් කාර්යාලවලට අනුයුක්ත කිරීමට ඇති හැකියාව සොයාබලා නොතිබීම. | කාර්යය මණ්ඩල සමාලෝචනයක් සිදුකරන ලෙස මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ ලේකම් වෙත අංක PL/6/7/4/SGP හා 2024.01.17 දිනැති ලිපිය මගින් රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙතද පිටපත් සහිතව ලිපියක් යොමු කරන ලදී. (ඇමුණුම 01)<br><br>ඒ අනුව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය, මුදල් කොමිෂන් සභාව, යන ආයතනවල සහාය ඇතිව කාර්යය මණ්ඩල සමලෝචනය සිදු කරමින් පවතී. මේ වන විට වයඹ හා බස්නාහිර පළාත් දෙක හැර ඉතිරි පළාත්වල සාකච්ඡා පවත්වා කාර්යය මණ්ඩල අවශ්‍යතාවයන් හඳුනාගෙන ඇත. |
| 07 | විගණකාධිපතිවරයාගේ සටහන - ඡේද අංක 2.5 (පළාත් ආදායම් දෙපාර්තමේන්තුව - යොමු අංකය 2022, 1.335.6(ආ)ii)<br><br>2019, 2021 වර්ෂවලදී ලියාපදිංචි කළ රු.95,400,000 ක් වූ තෑගි ඔප්පු 59 ක් සහ 2021 වර්ෂයේ රත්නපුර ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ ලියාපදිංචි කළ රු.ලක්ෂ 05 ට වැඩි ඔප්පු 3004 ක් සඳහා අයකළ මුද්දර ගාස්තුවල නිරවද්‍යතාවය පළාත් ආදායම් දෙපාර්තමේන්තුව විසින් තක්සේරු කර නොතිබීම. | මේ සම්බන්ධව රෙජිස්ට්‍රාර් ජෙනරාල් දෙපාර්තමේන්තුව හා සියලුම පළාත් ආදායම් කොමසාරිස්වරුන් සමඟ සාකච්ඡා කළ අතර එහිදී මුද්දර ගාස්තු රැස්කිරීමේ කාර්යයේදී ඊට සම්බන්ධ වන නොතාරිස් කාර්යාලය, බැංකුව, ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලය, පළාත් පාලන ආයතනය සහ පළාත් පාලන දෙපාර්තමේන්තුව යන ආයතන එකිනෙකට සම්බන්ධ නොවන නිසා ආදායම් රැස්කිරීමේ කාර්යයට බාධා ඇති වී ඇති බව අනාවරණය විය.<br><br>මේ වන විටත් වයඹ පළාත් ආදායම් දෙපාර්තමේන්තුව විසින් අනුගමනය කරන මාර්ගගත ක්‍රමවේදය භාවිතයෙන් මෙම ගැටළුව විසඳීමට හැකි බව යෝජනා විය. ඒ අනුව 2024.02.06 දින පැවති අන්තර් පළාත් විෂයය සම්බන්ධිකරණ සමුළුවේදී මෙම ක්‍රමවේදය පිළිබඳව සියලුම පළාත් ප්‍රධාන ලේකම්වරුන් හා පළාත් පාලන කොමසාරිස්වරුන් දැනුවත් කළ අතර එම ක්‍රමවේදය පළාත තුළ ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන ලෙස එම නිලධාරීන්ට දන්වන ලදී. ඒ පිළිබඳව අංක PL/6/7/4/SGP හා 2024.06.30 දිනැති ලිපියෙන් රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව දැනුවත් කර ඇත. (ඇමුණුම 02) |

Scanned with MOBILE SCANNER

| | | |
|---|---|---|
| 11 | **විගණකාධිපතිවරයාගේ සටහන - ඡේද අංක 2.10(පළාත් පාලන දෙපාර්තමේන්තුව - යොමු අංකය 2019, 5.4(අ))**<br><br>පළාත් පාලන ආයතන ප්‍රධානීන් වෙත අනුමත ඉන්ධන ලීටර් ප්‍රමාණයක් මාසිකව ලබාදෙමින් පැවතියදී පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් රු.5000/-ක සීමාවකට යටත්ව මාසික ඉන්ධන දීමනාවක් අනුමත කර තිබීම. | පළාත් පාලන ආයතනවල මහජන නියෝජිතයන්ගේ රාජකාරී ගමන් බිමන් සඳහා යොදා ගන්නා යතුරුපැදි සඳහා ඉන්ධන දීමනාව ලබාදීමට අදාළව විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ සැලකිල්ලට ගෙන අදාල චක්‍රලේඛ සංශෝධනය කර 2023.11.14 දිනැතිව සංශෝධිත නව චක්‍රලේඛයක් නිකුත් කිරීමට පළාත් පාලන කොමසාරිස් කටයුතු කර ඇති බව අංක PL/6/7/4/SGP හා 2024.03.29 දිනැති ලිපිය මගින් රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව දැනුවත් කර ඇත.(ඇමුණුම 03)<br><br>PL/6/7/4/SAB -1 හා 2025.07.16 දිනැති ලිපිය මගින් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත, 1987 අංක 42 දරන පළාත් සභා පනත, නගර සභා ආඥා පනත සහ මහා නගර සභා ආඥා පනතෙහි යම් යම් වගන්ති තුළින් වියදම් දැරීමට අනුමැතිය ලබාදීමේ බලය ගරු ආණ්ඩුකාරතුමා, අමාත්‍යවරයා හා පළාත් සභා වෙත පවරා ඇති බව පැහැදිලි කර කාරක සභාව වෙත යොමුකර ඇත.(ඇමුණුම 04) |

එස්.ආලෝකබණ්ඩාර
ලේකම්
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය

එස්.ආලෝකබණ්ඩාර
ලේකම්
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන
අමාත්‍යාංශය

Scanned with
MOBILE SCANNER

ඇමුණුම 01

# රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
පொது நிருவாக, உள்நாட்டலுவல்கள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சு
## Ministry of Public Administration, Home Affairs, Provincial Councils and Local Government


නිදහස් චතුරශ්‍රය, කොළඹ 07, ශ්‍රී ලංකාව.
சுதந்திர சதுக்கம், கொழும்பு 07, இலங்கை.
Independence Square, Colombo 07, Sri Lanka.


මගේ අංකය / எனது இல / My No: PL/6/7/4/SGP
ඔබේ අංකය / உமது இல / Your No:
දිනය / திகதி / Date: 2024.01. 17

ලේකම්
මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

**<u>සියලු පළාත් සභා සඳහා කාර්යය මණ්ඩල සමාලෝචනයක් සිදු කිරීම</u>**

2023.08.24 දින සබරගමුව පළාත් සභාවට අදාලව 2019,2020,2021 මුදල් වර්ෂවල විගණකාධිපති වාර්තා හා වර්තමාන කාර්යය සාධනය පරීක්ෂාව සඳහා පැවති රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ රැස්වීමේදී දකුණු පළාත් සභා ලේකම් කාර්යාලයට අනුයුක්තව 22 දෙනෙකු සේවය කරමින් සිටින නමුදු පළාත් සභාව විසුරුවා හැරීම නිසා කාරක සභා ඇතුළු විශාල කාර්යයභාරයක් අක්‍රීය වී තිබුණද වර්ෂ 05 ක කාලයක සිට පවතින සේවක අතිරික්තය, සභාවේ කාර්යයන් නැවත ආරම්භ කරන තෙක් ඵලදායි ලෙස වෙනත් කාර්යාලවලට අනුයුක්ත කිරීමට ඇති හැකියාව සොයා බලා නොමැති බව අනාවරණය විය.

02.විසුරුවා හරින ලද පළාත් සභාවල අතිරික්ත සේවකයන් පළාත් සභාව තුළ ඵලදායි ලෙස යොදා ගැනීමට අදාළව මෙම අමාත්‍යාංශය විසින් ප්‍රතිපත්තිමය තීරණයක් ගෙන කාරක සභාවට වාර්තා කරන ලෙස රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් නියෝග ලබාදී ඇත.

03. පළාත් සභා තුළ පවතින කාර්ය මණ්ඩලය සමාලෝචනය කිරීමට ඇති අවශ්‍යතාවය වාර ගණනාවකදී පෙන්වා දී ඇති මුත් මෙතෙක් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව එයට අවශ්‍ය පියවර ගෙන නොමැති අතර පළාත් සභාවල වසර 10 ඉක්මවා පුරප්පාඩුව පවතින තනතුරු ඇති අතර සමහර ආයතන වැඩ අධ්‍යයනයකින් තොරව අතිරික්ත කාර්යය මණ්ඩල පවත්වාගෙන යන බවද නිරීක්ෂණය වී ඇත.

04. බඳවා ගැනීම අත්හිටුවා ඇති මෙවැනි අවස්ථාවකදී අමතර කාර්යය මණ්ඩල සපයා දීමට නොහැකි නිසා නිසි පරිදි වැඩ අධ්‍යයනයක් සිදුකර අවශ්‍ය කාර්යය මණ්ඩලය නිශ්චය කර ගැනීම ඉතා කාලෝචිත හා අත්‍යවශ්‍යයෙන්ම සිදුවිය යුත්තක් බව නිරීක්ෂණය කරන බැවින් ද පළාත් සභාවන්හි කාර්යයන් කාර්යක්ෂම සිදුකර ගැනීම සඳහා ප්‍රශස්ත කාර්යය මණ්ඩලයක් පවත්වාගෙන යාම අතිශයින්ම වැදගත් බැවින් මේ සම්බන්ධව ඔබගේ ප්‍රමුඛ අවධානය යොමුකර කාර්යය මණ්ඩල සමාලෝචනයක් සිදු කිරීමට කටයුතු කරන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

ප්‍රදීප් යසරත්න
ලේකම්

පිටපත
01. ලේකම්, රාජ්‍ය ගිණුම් කාරක සභාව - කා.දැ.පි.
02. සියලුම පළාත් ප්‍රධාන ලේකම්වරුන් - කා.දැ.පි
03. අධ්‍යක්ෂ ජනරාල්, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව - කා.දැ.පි.


දුරකථන / தொலைபேசி / Telephone: 011-2696211-13, 011-2166000
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2695279
ඊ-මේල් / மின்னஞ்சல் / E-mail: information@pubad.gov.lk
වෙබ් අඩවිය / இணையத்தளம் / Website: www.pubad.gov.lk


Scanned with MOBILE SCANNER

ඇමුණුම 02

රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
பொது நிருவாக, உள்நாட்டலுவல்கள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சு
Ministry of Public Administration, Home Affairs, Provincial Councils and Local Government

නිදහස් චතුරශ්‍රය, කොළඹ 07, ශ්‍රී ලංකාව.
சுதந்திர சதுக்கம், கொழும்பு 07,இலங்கை.
Independence Square, Colombo 07, Sri Lanka.

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல<br>My No | PL/6/7/4/SGP | ඔබේ අංකය<br>உமதுஇல<br>Your No | | දිනය<br>திகதி<br>Date | 2024.06. 20 |

ලේකම්
රාජ්‍ය ගිණුම් කාරක සභාව

**2023.08.24 දින පවත්වන ලද රජයේ ගිණුම් පිළිබඳ කාරක සභා රැස්වීමේදී ලබාදුන් නියෝග - සබරගමුව පළාත් සභාවේ 2019,2020, 2021 මුදල් වර්ෂවල විගණකාධිපති වාර්තා හා වර්තමාන කාර්යසාධන පරීක්ෂාව**

උක්ත කරුණ සම්බන්ධව ඔබගේ අංක PAC/09/04/2023 හා 2023.09.04 දිනැති ලිපිය හා බැඳේ.

02. 2023.08.24 දින පවත්වන ලද රජයේ ගිණුම් පිළිබඳ කාරක සභා රැස්වීමේදී කාරක සභාව විසින් පළාත් 9 හිම ලියාපදිංචි කළ තෑගි ඔප්පු ගණන හා ලියාපදිංචි කළ තෑගි ඔප්පු සඳහා අය කළ මුද්දර ගාස්තුවල නිරවද්‍යතාවය තක්සේරු කිරීමේදී අතිරේකව ගණනය කළ ගාස්තු ප්‍රමාණය නිසි පරිදි, ලබා ගෙන පළාත් තුළ ආදායම් වර්ධනය කර ගැනීමට සුදුසු වැඩපිළිවෙළක් සකස් කරන ලෙසට නියෝග කර ඇත.

03. ඒ අනුව මේ පිළිබඳව රෙජිස්ට්‍රාර් ජෙනරාල් දෙපාර්තමේන්තුව හා සියළුම පළාත් වල පළාත් ආදායම් කොමසාරිස්වරුන් සමඟ සාකච්ඡාවක් පවත්වන ලදී. එම සාකච්ඡාවේදී මුද්දර ගාස්තු රැස්කිරීමේ කාර්යයේදී ආයතන 05ක් (නොතාරිස් කාර්යාලය, බැංකුව, ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලය, පළාත් පාලන ආයතනය, පළාත් පාලන දෙපාර්තමේන්තුව) ඊට සම්බන්ධ වන බවත් එම ආයතන එකිනෙකට සම්බන්ධ නොවන නිසා ආදායම් රැස්කිරීමේ කාර්යයට බාධා ඇතිවී ඇති බවත් සාකච්ඡා විය.

04. එසේම මේ වන විට වයඹ පළාත් ආදායම් දෙපාර්තමේන්තුව විසින් භාවිතා කරනු ලබන මාර්ග ගත ක්‍රමවේදය භාවිතයෙන් මෙම ගැටළුව විසඳීමට හැකි බව යෝජනා විය. ඒ අනුව 2024.02.06 දින පැවති අන්තර් පළාත් විෂය සම්බන්ධීකරණ සමුළුවේදී මෙම මාර්ගගත ක්‍රමවේදය පිළිබඳව සියළුම පළාත් ප්‍රධාන ලේකම්වරුන් හා පළාත් පාලන කොමසාරිස්වරුන් දැනුවත් කරන ලද අතර එම ක්‍රමවේදය එක් එක් පළාත තුළ ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලෙසට දැනුම් දෙන ලදී. එම ක්‍රමවේදය පළාත තුළ ක්‍රියාත්මක කළ පසු මුද්දර ආදායම ඉහළ නංවාගත හැකි බව කාරුණිකව දන්වා සිටිමි.

එම්.කොඩිප්පිලි ආරච්චි
අතිරේක ලේකම් (පළාත් සභා හා පළාත් පාලන)
ලේකම් වෙනුවට

දුරකථන : 011 2302086
ෆැක්ස් : 011 2347535
විද්‍යුත් ලිපිනය : prcouncilsb@gmail.com

පිටපත
01. සියළුම පළාත් ප්‍රධාන ලේකම්වරුන් - කා.දැ.පි. හා අ.ක.ස



Scanned with MOBILE SCANNER

ඇමුණුම 03

රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
பொது நிருவாக, உள்நாட்டலுவல்கள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சு
**Ministry of Public Administration, Home Affairs, Provincial Councils and Local Government**

නිදහස් චතුරශ්‍රය, කොළඹ 07, ශ්‍රී ලංකාව.
சுதந்திர சதுக்கம், கொழும்பு 07, இலங்கை.
Independence Square, Colombo 07, Sri Lanka.

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය / எனது இல / My No | PL/6/7/4/SGP | ඔබේ අංකය / உமது இல / Your No | | දිනය / திகதி / Date | 2024.03. 07 |

ලේකම්
රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව

**රජයේ විගණකාධිපතිගේ අංක 5.4 හා 2019 වර්ෂයේ විගණන ඡේදයට අදාළව 2023.08.24 දින පැවති පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ විමර්ශනය හා බැඳේ.**

උක්ත කරුණ සම්බන්ධව සබරගමුව පළාත් ප්‍රධාන ලේකම් විසින් මෙම අමාත්‍යාංශය වෙත යොමු කර ඇති අංක සිඑස්/12/01/04-(IV) හා 2024.02.19 දිනැති ලිපිය හා බැඳේ. (පිටපත අමුණා ඇත).

02. එකී ලිපිය මගින් පළාත් පාලන ආයතනවල මහජන නියෝජිතයින්ගේ රාජකාරී ගමන් බිමන් සඳහා යොදා ගන්නා යතුරු පැදි සඳහා ඉන්ධන දීමනාව ලබාදීමට අදාලව විගණකාධිපතිගේ නිරීක්ෂණ සැලකිල්ලට ගෙන අදාළ චක්‍රලේඛ සංශෝධනය කර 2023.11.14 දිනැතිව සංශෝධිත නව චක්‍රලේඛයක් නිකුත් කිරීමට පළාත් පාලන කොමසාරිස් විසින් කටයුතු කර ඇති බව දන්වා ඇත.

03. තවද රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව ලබාදුන් නියෝගය ප්‍රකාරව ප්‍රාදේශීය සභා පනත යටතේ දීමනා අනුමත කිරීමට අදාලව විෂයභාර අමාත්‍යවරයා ලෙස අදහස් කරන්නේ කවුරුන්ද යන්න පිළිබඳව නිතිමය අර්ථකථනය ලබාදිය හැක්කේ ශ්‍රේෂ්ඨාධිකරණයට පමණක් වන බැවින් මේ සම්බන්ධව නීතිපතිගෙන් උපදෙස් ලබාගැනීමට නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇති අතර අදාල උපදෙස් නීතිපති වෙතින් ලද පසු ඔබ දැනුවත් කිරීමට කටයුතු කරන බව වැඩිදුරටත් කාරුණිකව දන්වා සිටිමි.

එම්.කොඩිප්පිලි ආරච්චි
අතිරේක ලේකම් (පළාත් සභා හා පළාත් පාලන)
ලේකම් වෙනුවට

දුරකථන : 0112302086
ෆැක්ස් :0112347535
විද්‍යුත් ලිපිනය : prcouncilsb@gmail.com


දුරකථන / தொலைபேசி / Telephone: 011-2696211-13, 011-2166000
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2695279
ඊ-මේල් / மின்னஞ்சல் / E-mail: information@pubad.gov.lk
වෙබ් අඩවිය / இணையத்தளம் / Website: www.pubad.gov.lk


Scanned with MOBILE SCANNER

ඇමුණුම 04


# රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය
# பொது நிர்வாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சு
# Ministry of Public Administration, Provincial Councils and Local Government

පළාත් සභා සහ පළාත් පාලන අංශය, 330, යුනියන් පෙදෙස, කොළඹ 02.
மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சிப் பிரிவு, 330, யூனியன் பிளேஸ், கொழும்பு 02.
Provincial Councils and Local Government Division, 330, Union Place, Colombo 02.

දුරකථන / தொலைபேசி / Telephone: 011-2305326
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2329725
ඊ-මේල් / மின்னஞ்சல் / Email: secretary@pclg.gov.lk
වෙබ් අඩවිය / இணையத்தளம் / Website: https://mpclg.gov.lk/


මගේ අංකය / எனது இல / My No: PC/07/4/5/PB-1
ඔබේ අංකය / உமது இல / Your No:
දිනය / திகதி / Date: 2025.07.16

සභාපති
රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව

**<u>2023.10.24 දින පැවැත්වූ ලද රජයේ ගිණුම් පිළිබඳ කාරක සභා රැස්වීමේදී ලබාදුන් නියෝග-සබරගමුව පළාත් සභාවේ 2019,2020,2021 මූල්‍ය වර්ෂවල විගණකාධිපති වාර්තා හා වර්තමාන කාර්යසාධන පරීක්ෂාව</u>**

ඉහත කරුණ සම්බන්ධව ඔබගේ අංක PAC/09/04/2023 හා 2023.09.04 දිනැති ලිපිය හා බැඳේ.

02. එකී ලිපිය මගින් පූර්වෝක්ත රැස්වීමේදී "ප්‍රාදේශීය සභා පනතට අනුව යම් ප්‍රාදේශීය සභාවකට විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතිය මත දීමනා අනුමත කිරීමට බලය ඇති බවත්, එලෙස අමාත්‍යවරයා විසින් අනුමැතිය ලබාදුන් විටදීත් වුව ද විගණකාධිපතිවරයා විසින් එවා ප්‍රතික්ෂේප නොකරනු ලැබිය යුතු බවත් කාරක සභාවේදී අනාවරණය වූ හෙයින්, එම කරුණ සම්බන්ධයෙන් සහ යම් ආණ්ඩුකාරවරයෙක්ට, පළාත් සභාවක් හරහා, එම අමාත්‍ය මණ්ඩලයට හෝ යම් පළාත් පාලන ආයතනයකට එලෙස දීමනා අනුමත කිරීමට ඇති බලය පිළිබඳ නීතිමය අර්ථකථනය කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලෙස" නියෝගය ලබාදෙන ලදී.

03. 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 32(III) වගන්තියට අනුව මගින් පළාත් රාජ්‍ය සේවයේ නිලධාරීන්ට අදාළ සියලු කරුණු, ප්‍රතිපාදන තීරණය කිරීමේදී ආණ්ඩුකාරවරයා විසින් රාජ්‍ය සේවයේ අනුගමනය කරන ක්‍රියාපටිපාටි හැකිතාක් දුරට අනුගමනය කළ යුතුය. එසේම ජාතික ප්‍රතිපත්තිමය කරුණක් සේ සලකමින් ආයතන සංග්‍රහයේ විධිවිධාන පළාත් රාජ්‍ය සේවයට අදාල කර ගත යුතු යයිද, ආයතන සංග්‍රහයට කරනු ලබන කවර හෝ සංශෝධනයක් පළාත් රාජ්‍ය සේවයට අදාල කරගත යුතු යයි රජය විසින් තීරණය කර ඇති බවත් ආයතන සංග්‍රහයේ විධිවිධාන පළාත් රාජ්‍ය සේවයට අදාල කර ගැනීමේදී "රාජ්‍ය පරිපාලන ලේකම්/ආයතන අධ්‍යක්ෂ" යන වචන දැක්වෙන තැන්හි "ආණ්ඩුකාරවරයා" යන වචනය ආදේශ කර ක්‍රියාකරන ලෙස අංක පීඑස්/සීඑස්/11 හා 1990.06.05 දිනැති චක්‍රලේඛය මගින් පළාත් ආණ්ඩුකාර ලේකම්වරුන් වෙත දැනුම් දී ඇත. (ඇමුණුම 01) ඊ අනුව පළාත් සභාවක දීමනා අනුමත කිරීමේ බලය ආණ්ඩුකාරවරයා වෙත පවතී.

04. එමෙන්ම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත, 1987 අංක 42 දරන පළාත් සභා පනත, නගර සභා ආඥා පනත සහ මහා නගර සභා ආඥා පනතෙහි යම් යම් වගන්ති තුළින් වියදම් දැරීමට අනුමැතිය ලබාදීමේ බලය ගරු ආණ්ඩුකාරතුමා, අමාත්‍යවරයා හා පළාත් සභා වෙත පවරා ඇත. අදාල නීතිමය ප්‍රතිපාදන ඇමුණුම 02 ලෙස කාරුණිකව මේ සමඟ ඔබ වෙත යොමු කරමි.

එම්.කොඩිප්පිලි ආරච්චි
අතිරේක ලේකම් (පළාත් සභා හා පළාත් පාලන)
ලේකම් වෙනුවට


(දුරකථන : 011 23020286 / ෆැක්ස් : 011 2328282 / ඊමේල් :prcouncilsb@gmail.com)



Scanned with MOBILE SCANNER